# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/29 - 2022 ජනවාරි මස 12 වැනි බදාදා - 2022.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: BKP/LAND/ACQUI/D2/3/3-1.
ඉඩම් අමාත්‍යාංශ අංකය: 13/99/A/368.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගොඩ රජයේ රෝහලට අයත් ජල රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම. පහත සඳහන් ඉඩම් කැබලි අත්පත් කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුස්පනේ ග්‍රාම නිලධාරි වසමේ යටිදැරිය වත්ත අක්කර 50 ගම තුළ පිහිටි කැගල්ල මැනුම් අධිකාරියේ අංක මු.පි.කැ. 2806 දරන මූලික පිඹුරේ සඳහන් ඉඩම් කැබලි අංක 1 වේ.

**කැබලි අංකය 01**

ඉඩමේ නම: යටිදැරිය වත්ත අක්කර 50; හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය: 1, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්: 0.961.

වන්දි හිමිකම් පරීක්ෂණ දින :-

මු.පි.කැ. 2806 පිඹුරේ කැබලි අංක 1 *සඳහා* 2022 අප්‍රේල් මස 25 වෙනි දින පෙ.ව.10.00ට

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන් හි හා වෙලාවන් හිදි බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 අප්‍රේල් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ජේ. එම්. රම්‍යා ජයසුන්දර,**
ප්‍රාදේශීය ලේකම්/ ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
බුලත්කොහුපිටිය.

2022 ජනවාරි මස 06 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 1-0128


1A - G 35811 – 22 (2022/01)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*